ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

**සන්නිවේදන දෙපාර්තමේන්තුව**
30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
දුරකථන අංක: 2477424, 2477423, 2477418
ෆැක්ස්: 2346257, 2477739
ඊ-මේල්: dcommunications@cbsl.lk, communications@cbsl.lk
වෙබ් අඩවිය: www.cbsl.lk

# පුවත්පත් නිවේදනය

| නිකුත් කළේ | සන්නිවේදන දෙපාර්තමේන්තුව |
|---|---|
| දිනය | 2018 ජනවාරි මස 11 වැනි දින |

## ශ්‍රී ලංකා මහ බැංකු මුදල් මණ්ඩලය විසින් කෙරෙන ප්‍රකාශයයි

2015 පෙබරවාරි 1 සිට 2016 මාර්තු 31 දක්වා කාලය තුළ භාණ්ඩාගාර බැඳුම්කර නිකුත් කිරීම් පරීක්ෂා කිරීම, විමර්ශනය කිරීම සහ වාර්තා කිරීම සඳහා වූ ජනාධිපති කොමිසමේ නිර්දේශ සම්බන්ධවත්, රාජ්‍ය ණය සහ සේවක අර්ථ සාධක අරමුදල කළමනාකරණය කිරීම සහ පාලනය කිරීම සඳහා ගෙන ඇති පියවර සම්බන්ධවත් ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය විසින් නිකුත් කරනු ලැබූ ප්‍රකාශය

2015 පෙබරවාරි 1 සිට 2016 මාර්තු 31 දක්වා කාලය තුළ භාණ්ඩාගාර බැඳුම්කර නිකුත් කිරීම් පරීක්ෂා කිරීම, විමර්ශනය කිරීම සහ වාර්තා කිරීම සඳහා වූ ජනාධිපති කොමිසමේ වාර්තාව, එහි ඇතුළත් නිර්දේශයන් ක්‍රියාත්මක කිරීමට සලකා බැලීම සඳහා, ජනාධිපති ලේකම්තුමා විසින් 2018 ජනවාරි 10 වැනි දින ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපතිතුමා වෙත භාර දෙනු ලැබිණි.

මහ බැංකුව විසින් දැනටමත් එහි අඩංගු ඇතැම් නිර්දේශයන් ක්‍රියාවට නංවා ඇති අතර අනෙකුත් නිර්දේශයන් බොහොමයක් ද ක්‍රියාත්මක කිරීම ආරම්භ කර තිබේ. මුදල් මණ්ඩලය විසින් එම පියවර ගැනීමේදී නිසි පරිදි නීතිපතිතුමාගේ උපදෙස් ලබා ගෙන ඇත. එකී වාර්තාවේ ඇතුළත් නිර්දේශයන්ට අදාළව මෙතෙක් ගනු ලැබ ඇති සහ ගැනෙමින් පවතින පියවර සහ ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් මහජනතාව වෙත දැනුම් දීමත්, පොදුවේ රාජ්‍ය ණය සහ සේවක අර්ථ සාධක අරමුදල කළමනාකරණය කිරීමේ කටයුතු සම්බන්ධව විනිවිදභාවය වර්ධනය කිරීමත් සුදුසු බව මුදල් මණ්ඩලය අදහස් කරයි. මුදල් මණ්ඩලය විසින් ජනාධිපති කොමිසමේ වාර්තාව අඛණ්ඩව සැලකිල්ලට ගනු ඇති අතර සුදුසු පරිදි වැඩි දුර ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරනු ඇත.

1. **ව්‍යවස්ථාපිත පනත් සංශෝධනය කිරීම :**

■ 2017 වසර මැදදී ආරම්භ කරන ලද නීති ප්‍රතිශෝධන වැඩසටහනක් මේ වන විට ක්‍රියාත්මකව පවතී. වර්තමාන ආර්ථික සහ මූල්‍ය පරිසරය සලකා බලමින් මුදල් නීති පනතට මෙන්ම ලියාපදිංචි කොටස් සහ සුරැකුම් ආඥා පනත (Registered Stocks and Securities Ordinance) සහ දේශීය භාණ්ඩාගාර බිල්පත් ආඥා පනත (Local Treasury Bills Ordinance) ඇතුළු අනෙකුත් ප්‍රධාන අණ පනත්වලට ද හඳුන්වා දිය යුතු සංශෝධනයන් මේ වන විට සකස් කෙරෙමින් පවතී.

■ වගකීම් කළමනාකරණ පනත (Liability Management Act) නමැති නව පනතක් 2018 මුල් භාගයේදී බලාත්මක කිරීමට අපේක්ෂා කෙරේ. වගකීම් කළමනාකරණ පනත මගින් නැවත මිලදී ගැනීම්, මාරු කිරීම් සහ පූර්ව මූල්‍ය සැපයුම් කටයුතු වැනි සක්‍රීය ණය කළමනාකරණ කාර්යයන් සඳහා නම්‍යශීලී බවක් ලැබෙනු ඇත. එසේම හිඟ ණය කළඹෙහි කල්පිරුම් ගොනුව වෙනස් කිරීම මගින් යටිතල ණය කළඹ සම්බන්ධ ප්‍රති අවදානම අවම කිරීමට ද එමගින් හැකි වනු ඇත. තවද, උපාය මාර්ගික නොවන වත්කම් අලෙවියෙන් ලැබෙන විශේෂ

අරමුදල් පවත්වා ගැනීමට ද එමගින් හැකියාව ලැබේ. වගකීම් කළමනාකරණ පනතේ විධිවිධාන මගින් දේශීය හා විදේශීය යන අංශ දෙකෙහිම රාජ්‍ය ණයට අදාළ අවදානම් ගොනුව පුළුල් කිරීමට අපේක්ෂිතය.

**2. ණය කළමනාකරණ මෙහෙයුම්වල විනිවිදභාවය සහ කාර්යක්ෂමතාව වැඩි කිරීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග**

2.1. රාජ්‍ය සුරැකුම්පත්වල ප්‍රාථමික නිකුතුන් සඳහා නව වෙන්දේසි ක්‍රමයක් හඳුන්වා දීම සහ ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර සඳහා ද්විතියික වෙළඳපොළක් වර්ධනය කිරීම.

■ රජයේ දේශීය ණයගැනීම්වල කාර්යක්ෂමතාව සහ විනිවිදභාවය තව දුරටත් වැඩි දියුණු කිරීම උදෙසා භාණ්ඩාගාර බැඳුම්කර සඳහා පැවැති සම්පූර්ණයෙන්ම වෙන්දේසි කිරීම මත පදනම් වූ නිකුතු ක්‍රමය වෙනුවට 2017 ජූලි මාසයේදී නව ප්‍රාථමික නිකුතු ක්‍රමයක් හඳුන්වා දෙනු ලැබිණි. භාණ්ඩාගාර බිල්පත් නිකුත් කිරීම සඳහා වන නව ක්‍රමයක් ද නුදුරු කාලයේදීම හඳුන්වා දෙනු ඇත.

■ ඉහත ක්‍රියාමාර්ගවල ප්‍රතිඵලයක් ලෙස 2017 ජූලි මාසයේ සිට වෙන්දේසිවලදී ඇති වන හිඟයන් මුල්‍යනය කිරීම මහ බැංකුව විසින් සිදු නොකර, සම්පූර්ණ භාණ්ඩාගාර අරමුදල් අවශ්‍යතාව වෙළඳපොළ වෙතින්ම රැස් කර ගැනීමට මහ බැංකුවට හැකි වී ඇත. මෙයට අමතරව, 2018 වසර මුලදී ඇති වන ඉහළ අරමුදල් අවශ්‍යතාව සපුරා ගැනීම වෙනුවෙන් 2017 වසරේ දෙවන භාගය තුළ සිදු කළ නව භාණ්ඩාගාර බැඳුම්කර නිකුතුවේදී නව වෙන්දේසි ක්‍රමය යටතේ අමතර රුපියල් බිලියන 110.16 ක මුදලක් රැස් කර ගැනීමට මහ බැංකුව සමත් විය.

■ ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර සඳහා විද්‍යුත් ලංසු තැබීමේ ක්‍රමවේදයක් (Electronic Bidding System) හඳුන්වා දෙනු ලබන අතර එමගින් ද්විතියික වෙළඳපොළ කටයුතු සඳහා පහසුකම් සලසනු ඇත.

2.2. රාජ්‍ය ණය මෙහෙයුම්වල සහ රජයේ සුරැකුම්පත් සම්බන්ධ ද්විතියික වොළඳපොළ කටයුතුවල ආරක්ෂාව වැඩි කිරීමට සහ විනිවිදභාවය තහවුරු කිරීමට ගෙන ඇති පියවර

■ වෙළඳපොළ අවභාවිතයන්ට හේතු විය හැකි තොරතුරු අසමතුලිතතාවන් වැළැක්වීම සඳහා රජයේ සුරැකුම්පත්වල ප්‍රාථමික නිකුතුන්ට සහ ලංසු තැබීමට පෙර පැවැත්වෙන සාකච්ඡාවන්හිදී ප්‍රාථමික ගැණුම්කරුවන් සහ ආයෝජකයන් සමග තොරතුරු හුවමාරු කර ගැනීමේ අවස්ථාව පුළුල් කර තිබේ.

■ භාණ්ඩාගාර බිල්පත් සහ භාණ්ඩාගාර බැඳුම්කර නිකුත් කිරීම් සම්බන්ධ කාර්තුමය දින දර්ශනයක් ප්‍රකාශයට පත් කෙරෙන අතර එම දින දර්ශනයට අනුකූල වන පරිදි නිකුතුන් සංවිධානය කෙරේ. ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර නිකුත් කිරීම් සම්බන්ධයෙන් ද මුදාහැරීම් සහ නිකුත්කිරීම්වලට අදාළ අනුමත සීමාවන් මත පදනම් වූ දින දර්ශනයක් සැලසුම් කෙරෙමින් පවතී.

■ අපේක්ෂණ හැකියාව වැඩි කරමින්, සමස්තයක් වශයෙන් වෙන්දේසිවලදී ලබා ගනු ලබන මුදල් ප්‍රමාණය, ඉල්ලා සිටිනු ලැබූ ප්‍රමාණයට සීමා කර ඇත.

■ භාණ්ඩාගාර බිල්පත්, භාණ්ඩාගාර බැඳුම්කර සහ ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කරවලට අදාළ ටෙන්ඩර් මණ්ඩල සඳහා භාණ්ඩාගාර ලේකම් විසින් නම් කරනු ලබන දෙදෙනෙකු බැගින් ඇතුළත් කිරීම මගින් එම මණ්ඩලවල මුදල් අමාත්‍යාංශ නියෝජනය ශක්තිමත් කර තිබේ.

■ 2016 වසරේ සිට රජයේ සුරැකුම්පත් ගනුදෙනු සඳහා විද්‍යුත් බැඳුම්කර අලෙවි පද්ධතියක් (Electronic Bond Trading Platform) භාවිතා කරන ලෙස ප්‍රාථමික අලෙවිකරුවන්ට සහ බලපත්‍රලාභී බැංකුවලට නියම කර ඇත.

■ රාජ්‍ය සුරැකුම්පත්වල ද්විතියික වෙළඳපලෙහි ගනුදෙනු බ්ලූම්බර්ග් (Bloomberg) පද්ධතියේ වාර්තා වන අතර මිල ගවේශන පහසුකම් වැඩි කිරීම සහ තොරතුරු අසමතුලිතභාවය අවම කිරීම සඳහා ද්විතියික වෙළඳපොළ ගනුදෙනුවල සාරාංශගත වාර්තාවක් ශ්‍රී ලංකා මහ බැංකු වෙබ් අඩවියෙහි දිනපතා පළ කෙරේ.

■ රාජ්‍ය ණය දෙපාර්තමේන්තුවේ ඉදිරි කාර්යාලය තුළ හඬ පටිගත කිරීමේ පද්ධතියක් යොදවා ඇති අතර රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව තුළ සමීපස්ථ පරිපථ කැමරා පද්ධතියක් (CCTV Camera System)ද ස්ථාපිත කර තිබේ. එම දෙපාර්තමේන්තුව වෙත ප්‍රවේශය සීමා කර ඇති අතර බාහිර පුද්ගලයන් විශේෂයෙන් සකසා ඇති මහ බැංකුවේ බාහිර අමුත්තන් සඳහා වන ලියාපදිංචි කිරීමේ ක්‍රමවේදය යටතේ ලියාපදිංචි විය යුතුය.

■ රාජ්‍ය ණය දෙපාර්තමේන්තුවේ ආවේක්ෂණ, පාලන, නිරීක්ෂණ, ආරක්ෂණ සහ දත්ත ආරක්ෂණ යනාදී පටිපාටීන් ශක්තිමත් කරනු ලැබ ඇති අතර විශේෂඥ තාක්ෂණික සහාය යටතේ වැඩි දුර පුළුල් කිරීම් සිදු කිරීමට නියමිතව ඇත.

■ ගනුදෙනුකාර පාර්ශවයන්ට ඇති අවදානම් තත්වයන් අවම කිරීම උදෙසා විද්යුත් ගනුදෙනු පද්ධතියක් (Electronic Trading Platform) සහ මධ්‍යස්ථ ගනුදෙනුකාර පාර්ශව ආයතනයක් (Central Counterparty) ස්ථාපිත කිරීමේ අරමුණින් ඒ සම්බන්ධ මූලික වැඩ කටයුතු ආරම්භ කර ඇත.

**3. සේවක අර්ථ සාධක අරමුදලේ ආයෝජන තීරණ ගැනීමේ ක්‍රියාවලියෙහි මෙන්ම අභ්‍යන්තර පාලන ව්‍යුහයෙහි විනිවිදභාවය සහ මනා පාලනය වැඩි දියුණු කිරීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග.**

3.1. සේවක අර්ථ සාධක අරමුදලේ ආයෝජන සම්බන්ධයෙන් ගනු ලැබූ පියවර

■ 2016 මැයි මස සිට බල පැවැත්වෙන පරිදි, ද්වීතියික වෙළඳපොළ ගනුදෙනු ක්‍රමයෙන් අඩු කරන ලදී. එහි වෙළඳපොළ කටයුතු තුළින් පැන නැගුණු තත්ත්වයන් හේතුවෙන් මුදල් මණ්ඩලය විසින් 2016 ඔක්තෝබර් මාසයේදී සේවක අර්ථසාධක අරමුදල භාණ්ඩාගාර බැඳුම්කර සහ ප්‍රති විකුණුම් හා සම්බන්ධ ද්වීතියික වෙළඳපොලට සහභාගී වීම සීමා කරන ලදී. මෙම සීමා කිරීම අතරතුරදී අභ්‍යන්තර පාලන ක්‍රියාමාර්ග ශක්තිමත් කෙරෙනු ඇත.

■ සේවක අර්ථ සාධක අරමුදලට ඇති සීමිත ආයෝජන අවස්ථා සලකා බලමින්, තාවකාලික ක්‍රියාමාර්ග යක් වශයෙන්, රාජ්‍ය බැංකුවල ස්ථාවර තැන්පතු සහ මහ බැංකුවේ නිත්‍ය තැන්පතු පහසුකම වැනි විකල්ප ආයෝජන මාර්ගවලට යොමු වීම සඳහා මුදල් මණ්ඩලය විසින් අවසර ලබා දී ඇත.

■ ආයෝජන තීරණ ගැනීමේ ක්‍රියාවලිය ශක්තිමත් කිරීමට මෙන්ම සේවක අර්ථ සාධක අරමුදලේ කළඹ කළමනාකරණ ක්‍රියාකාරකම් නිසි මගට ගැනීම සඳහා මෑත කාලයේදී ගනු ලැබූ පියවරයන් සැලකිල්ලට ගනිමින්, 2017.07.06 දින සිට බල පැවැත්වෙන පරිදි, ආයෝජන කමිටුව විසින් දක්වන ආයෝජන මාර්ගෙ ෝපදේශයන්ට තරයේ අවනත වෙමින් වෙළඳපොළ සහභාගිකරුවන් සමග ප්‍රති මිලදී ගැනීම් ගනුදෙනු සිදු කිරීම සහ ද්වීතියික වෙළඳපොළෙන් රජයේ සුරැකුම්පත් මිලදී ගැනීම නැවත ආරම්භ කිරීමට මුදල් මණ්ඩලය විසින් අනුමැතිය ලබා දෙන ලදී.

3.2. සේවක අර්ථ සාධක අරමුදලේ ආයෝජන තීරණ ගැනීමේ ක්‍රියාවලියෙහි විශ්වසනීයත්වය වැඩිකිරීම සඳහා ගනු ලැබූ පියවර

■ සේවක අර්ථ සාධක අරමුදලේ ආයෝජන තීරණ ගැනීමේ ක්‍රියාවලියෙහි අභ්‍යන්තර පාලන ක්‍රමවේදයන් තව දුරටත් ශක්තිමත් කිරීම උදෙසා සේවක අර්ථ සාධක අරමුදල භාරව සිටින සහකාර අධිපතිවරයාගේ ප්‍රධානත්වයෙන් යුත් ආයෝජන කමිටුව 2016 නොවැම්බර් මස සිට දිනපතා රැස්වීමක් පැවැත්වීමට කටයුතු යොදන ලදී.

■ 2016 නොවැම්බර් මාසයේ සිට සියලුම ආයෝජනයන් ආයෝජන කමිටුවේ අනුමැතිය මත සිදු කරන ලද අතර රජයේ සුරැකුම්පත්වලින් පිටත ආයෝජනයන් සඳහා මුදල් මණ්ඩලයේ පූර්ව අනුමැතිය ලබා ගන්නා ලදී.

3.3. අභ්‍යන්තර පාලන පද්ධතිය ශක්තිමත් කිරීම සඳහා ගනු ලැබූ පියවර

■ සේවක අර්ථ සාධක අරමුදලේ ආයෝජන කටයුතු නිරීක්ෂණය කිරීමේ සහ ආයෝජන සඳහා අයෝජන සහ අලෙවිකරණ මාර්ගෝපදේශය පිළිබඳ සංශෝධන ඇතුළු අවදානම් මිනුම් සකස් කිරීමේ වගකීම අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුව වෙත පවරනු ලැබිණි.

■ ඉදිරි කාර්යාලය සඳහා ප්‍රවේශය පාලනය කිරීමේ සහ හඬ පටිගත කිරීමේ උපාංග හඳුන්වා දෙනු ලැබූ අතර නුදුරේදීම එම පද්ධතීන් මැදි කාර්යාලය, පසු කාර්යාලය සහ අරමුදල් කළමනාකරණයට සම්බන්ධ ජ්‍යෙෂ්ඨ කළමනාකාරවරුන් ද ආවරණය වන පරිදි පිහිටුවනු ඇත. සමීපස්ථ පරිපථ කැමරා පද්ධතියක් (CCTV Camera) පිහිටුවීම මේ වන විට සිදු කෙරෙමින් පවතී.

- රජයේ සුරැකුම්පත් සම්බන්ධ ද්වීතියික වෙළඳපොළ ගනුදෙනු සිදු කිරීමේදී විද්‍යුත් අලෙවි මාධ්‍යයන් (බ්ලූම්බර්ග් පද්ධති පහසුකම් ) භාවිතා කිරීමට කටයුතු සලස්වා ඇති අතර අරමුදල් කළමනාකරණ අංශයේ අනෙකුත් නිලධාරීන් සඳහා ද බ්ලූම්බර්ග් පද්ධති පහසුකම් ලබා දී ඇත.

- ආයතනියේ ශක්‍යතා වර්ධනය කිරීමේ ක්‍රියාවලිය වැඩි දියුණු කිරීමේ අරමුණ පෙරදැරිව, සේවක අර්ථ සාධක අරමුදල් දෙපාර්තමේන්තුව විසින් ප්‍රාග්ධන වෙළඳපොළ සංවර්ධන ව්‍යාපෘතිය යටතේ ආසියානු සංවර්ධන බැංකුවේ තාක්ෂණික සහය අඛණ්ඩව ලබා ගැනීමට ක්‍රියා කර ඇත. එයට අමතරව සේවක අර්ථ සාධක අරමුදල සිය සමස්ත ආයෝජන ක්‍රමවේදය වර්ධනය කර ගැනීම සඳහා ලෝක බැංකුවේ සහාය ද ලබා ගනී.

- 2017 ජනවාරි මාසයේ සිට ආයෝජන සම්බන්ධයෙන් ආයෝජන කමිටු රැස්වීම්වල කෙරෙන සාකච්ඡා පටිගත කරන ලදී.

- අරමුදල් කළමනාකරණ අංශය සඳහා අමතර කාර්ය මණ්ඩලයක් යොදවන ලදී.

- අරමුදල් කළමනාකරණ අංශය, ප්‍රවේශ පාලන ලද්ධතියක් සහිත මහ බැංකු ප්‍රධාන කාර්යාලය වෙත ගෙන යන ලදී.

**4. පර්පෙචුවල් ට්‍රෂෙරීස් ලිමිටඩ් සහ පෑන් ඒෂියා බැන්කින් කෝපරේෂන් පී.එල්. සී. සම්බන්ධයෙන් ගනු ලැබූ නියාමන ක්‍රියාමාර්ග.**

4.1. පර්පෙචුවල් ට්‍රෂෙරීස් ලිමිටඩ්

පර්පෙචුවල් ට්‍රෂෙරීස් ලිමිටඩ් ආයතනයට අදාළ අධීක්ෂණ කටයුතුවලදී අනාවරණය වූ කරුණු හා එතැන් පරීක්ෂණ වාර්තාව මගින් හඳුනාගත් අදාළ නීතිරීතිවලට අනුකූල නොවීමේ අවස්ථා සහ අනෙකුත් විමර්ශනයන්ගෙන් හෙළි වූ කරුණු පදනම් කර ගෙන පර්පෙචුවල් ට්‍රෂෙරීස් ආයතනයේ ප්‍රාථමික හා ද්වීතියික වෙළඳපොළ කටයුතු අත්හිටුවීමටත්, එහි දේපළ බැහැර කිරීම වැළැක්වීමටත් 2016.11.07 වන දින මුදල් මණ්ඩලය විසින් නියෝගයක් නිකුත් කරන ලදී. අඛණ්ඩව සිදු කෙරුණු විමර්ශනයන්ගෙන් හෙළි වූ කරුණු මත වරින් වර වැඩි දුර නියෝග යන් නිකුත් කෙරුණු අතර මේ වන විට ඔවුන්ගේ ව්‍යාපාර කටයුතු අත්හිටවනු ලැබ ඇත. දේපළ බැහැර කිරීමෙන්, ලාභ බෙදා හැරීමෙන් සහ ශ්‍රී ලංකා මහ බැංකුවේ පූර්ව අනුමැතියකින් තොරව කිසිදු ගෙවීමක් සිදු කිරීමෙන් පර්පෙචුවල් ට්‍රෂෙරීස් ලිමිටඩ් ආයතනය වළක්වනු ලැබ තිබේ. මෙම නියෝග 2018.07.06 දින දක්වා බල පැවැත්වේ. මහ බැංකුව භාරයේ ඇති පර්පෙචුවල් ට්‍රෂෙරීස් ලිමිටඩ් ආයතනයට අයත් වත්කම් තහනමට ලක් කර ඇති අතර සුරැකුම්පත් හා විනිමය හුවමාරු කොමිසම යටතට වැටෙන වත්කම් සම්බන්ධයෙන් ද සුදුසු පියවර ගන්නා ලෙස දන්වා ඇත.

4.2. පෑන් ඒෂියා බැන්කින් කෝපරේෂන් පී.එල්.සී.

පෑන් ඒෂියා බැන්කින් කෝපරේෂන් පී.එල්.සී. ආයතනය රජයේ සුරැකුම්පත් වෙළඳපොළ තුළ සැලකිය යුතු මට්ටමකට අනිසි මැදිහත්වීම් කර තිබෙන බවට බැලූ බැල්මට පෙනී යන පරිදි විමර්ශනවලදී කරුණු අනාවරණය වීමෙන් පසු මුදල් මණ්ඩලය විසින් නිසි ක්‍රමවේදය අනුව කටයුතු කර 2017.08.15 දින සිට මාස 6 කට පෑන් ඒෂියා බැන්කින් කෝපරේෂන් පී.එල්.සී. ආයතනය ප්‍රාථමික ගනුදෙනුකරුවකු ලෙසට සිදු කරන ව්‍යාපාර හා කටයුතු අත්හිටුවමින්, 2017.08.14 දින නියෝගයක් නිකුත් කරන ලදී. මෙයට අදාළ විමර්ශන කටයුතු තවදුරටත් සිදු කෙරෙන අතර එහිදී හෙළි වන කරුණු මත වැඩි දුර පියවර ගැනීමට ක්‍රියා කරනු ඇත.

**5. විනය ක්‍රියාමාර්ග**

ශ්‍රී ලංකා මහබැංකුව විසින් සිදු කරන ලද අභ්‍යන්තර පරීක්ෂණ සහ විමර්ශන කටයුතුවලින් අනාවරණය වූ කරුණු මත, ශ්‍රී ලංකා මහ බැංකු අත්පොතේ වර්ගීකරණ, පාලන සහ අභියාචනා රීතීන්හි විධිවිධානවලට අනුකූලව කාර්යමණ්ඩල සාමාජිකයන් කිහිපදෙනෙකුට එරෙහිව විනය ක්‍රියාමාර්ග ගන්නා ලදී. ඒ අතරින් හතරදෙනෙකු මේ වන විට වැඩ තහනමට ලක් කරනු ලැබ ඇත.

**6. අනෙකුත් ක්‍රියාමාර්ග**

- ශ්‍රී ලංකා මහබැංකුව විසින් මුදල් මණ්ඩලයේ සාමාජිකයන් සහ බැංකු කාර්ය මණ්ඩලය සඳහා පොදුවේ බලපාන විනය රීති සංග්‍රහයක් ද, සේවක අර්ථසාධක අරමුදලේ සහ රාජ්‍ය ණය දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලය සඳහා බලපාන විශේෂ විනය නීති සංග්‍රහයක් ද දැනටමත් කෙටුම්පත් කර ඇත. මුදල් මණ්ඩලය විසින් අනුමත කිරීමෙන් පසු එම විනය රීති සංග්‍රහයන් බලාත්මක වනු ඇත.

- අදාළ කටයුතු අඛණ්ඩවව විමසා බැලීමේ සහ අනුකූලතාව සහතික කිරමේ පුළුල් පියවරක් වශයෙන් නීති සහ අනුකූලතා දෙපාර්තමේන්තුව ශක්තිමත් කිරීමටත්, 2018.01.01 දින සිට බලාත්මක වන පරිදි නිරාකරණ සහ බලගැන්වීම් දෙපාර්තමේන්තුව (Resolution and Enforcement Department) පිහිටුවීමටත් මහ බැංකුව විසින් මේ වන විටත් පියවර ගෙන ඇත.

- අභ්‍යන්තර විගණන කටයුතුවල විෂය පථය තව දුරටත් පුළුල් කිරීම සහ එමගින් මුදල් මණ්ඩලය වෙත ස්වාධීන තහවුරුවක් ලබා දීම පිණිස එම කටයුතුවල ඵලදායීතාව ඉහළ නැංවීමට අවශ්‍ය පටිපාටීන් ශක්තිමත් කිරීම යන අරමුණු පෙරදැරිව මුදල් මණ්ඩලය විසින් මහ බැංකුවේ අභ්‍යන්තර විගණන කටයුතු සමාලෝචනය කරනු ඇත.

**7. 2008 වසරේ සිට 2014 වසර දක්වා කාලය තුළ භාණ්ඩාගාර සිදු වූ බැඳුම්කර නිකුත් කිරීම් සහ 2016 මාර්තු මාසයේ පැවැත්වූ භාණ්ඩාගාර බැඳුම්කර නිකුතුව සම්බන්ධයෙන් වෝහාරික විගණනයන් සිදු කිරීමට මුදල් මණ්ඩලය විසින් පියවර ගනු ලැබේ.**